අපේ රට අපේ දෑතින්

# ලස්සන කරමු

Cleanup
Sri Lanka

www.cleanupsrilanka.lk

CLEANUP SRI LANKA.
යුතුකමේ හෙවන
මෙහෙයුම
2025
One Island, One Duty. Let's Clean Sri Lanka Together






## ව්‍යාපෘතිය ගැන...

නොදිරන ප්ලාස්ටික් රබර් වැනි කැළිකසළ පරිසරයට සිදු කරන බලපෑම
දිනෙන් දින වැඩිවන මෙවන් කාලයක එම අවදානමෙන් අනාගත පරපුර මුදවනු පිණිසත්,
වත්මන් පරපුරේ සහ දුවාදරුවන්ගේ
පරිසරය පිළිබඳ ඇති ආකල්ප යහපත් කරනු පිණිසත්, ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

**සහයෝගීතාවය 2024 - CleanUp Sri Lanka තෙවන ව්‍යාපෘතිය**

ශ්‍රද්ධා TV | ලක්විරු FM | SCO SHRADDHA CHARITY ORGANIZATION | Youth Distict 306 B2 | Interact District 3220 | Rotaract District 3220

# සමාරම්භක උත්සවය 2024




**CleanUp Sri Lanka 2024** සමාරම්භක උළෙල **ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ ගරු අනුශාසක පූජ්‍යපාද අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ** වරප්‍රමුඛ මහා සඟරුවනේ ආශීර්වාදයෙන් **මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් එම්. සිවකුමාර් මහතා** ඇතුළු සම්භාවනීය පිරිසකගේ සහභාගීත්වයෙන් **2024.09.28** කඩුවෙල නගර මධ්‍යයේ දී පැවැත්විණි. මේ මොහොතට ලෝක සෞඛ්‍ය සංවිධානයේ හිටපු කලාපීය උපදේශක සෞඛ්‍ය අමාත්‍යංශයේ හිටපු ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ **විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා**, පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති **නීතිඥ නිහාල් තල්දුව මහතා**, **ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ ගරු සභාපති සුදත් අන්නාසිවත්ත මහතා** ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය, කඩුවෙල මහමෙව්නාව භාවනා අසපුවේ **තාවතිංස යාත්‍රා යොවුන් සභාවේ පිරිස** සහ කඩුවෙල මහමෙව්නාව භාවනා අසපුවේ **උපස්ථාන කමිටුවේ මහත්ම මහත්මීන්** ඇතුළු පිරිසක් සහභාගී වූහ.

| | | |
|---|---|---|
| **15,000** | වියාපෘති | බැහැර කළ නොදිරන කැළි කසළ ප්‍රමාණය |
| වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් | **500** | **ටොන් 4 කට අධිකයි** |

**CleanUp Sri Lanka** පළමු අදියරයේ දී ව්‍යාපෘති 319ක් ඔස්සේ කසළ ටෝන් **2.5ක්** පමණ බැහැර කිරීමට හැකි වූ අතර එම ප්‍රමාණයන් වල සාධනීය වර්ධනයක් දෙවන අදියරයේ දී සිදුකර ගැනීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි.

# ප්‍රධාන ව්‍යාපෘතිය - කඩුවෙල



සමාරම්භක උත්සවයට සමගාමීව CleanUp Sri Lanka දෙවන අදියරය ද කඩුවෙල නගරය සහ ඒ අවට ප්ලාස්ටික් සහ නොදිරන අනෙකුත් කැළි කසළ ඉවත් කිරීමේ කටයුතු වලින් ආරම්භ විය.







තඹකන්ද මහමෙව්නාව භාවනා අසපුව

කුණ්ඩසාලේ මහමෙව්නාව භාවනා අසපුව

පොල්ගහවෙල
මහමෙව්නාව වනසෙනසුන

දෙවන ව්‍යාපෘතියේ ද සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරමින් ලංකාව පුරා **මහමෙව්නාව භාවනා අසපු සංචිත** මූලිකත්වයෙන් **මධ්‍යස්ථාන 17 ක් පුරා** මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

ඒ සඳහා දායකත්වය දැක් වූ මහමෙව්නාව භාවනා අසපු

| | | | | | |
|---|---|---|---|---|---|
| කඩුවෙල මහමෙව්නාව භාවනා අසපුව | ලග්ගල මහමෙව්නාව භාවනා අසපුව | අනුරාධපුර මහමෙව්නාව භාවනා අසපුව | තඹකන්ද මහමෙව්නාව භාවනා අසපුව | කහටගස්දිගිලිය මහමෙව්නාව භාවනා අසපුව | ගලෙන්බිඳුනු වැව මහමෙව්නාව භාවනා අසපුව |
| මාතලේ මහමෙව්නාව භාවනා අසපුව | ඉබ්බාගමුව මහමෙව්නාව භාවනා අසපුව | බෝවත්ත මහමෙව්නාව භාවනා අසපුව | ඇල්පිටිය මහමෙව්නාව භාවනා අසපුව | පොල්ගහවෙල මහමෙව්නාව භාවනා අසපුව | කැබිතිගොල්ලෑව මහමෙව්නාව භාවනා අසපුව |
| බෙලිඅත්ත මහමෙව්නාව භාවනා අසපුව | මහියංගනය මහමෙව්නාව භාවනා අසපුව | මාලබේ බුදු පසේබුදු අරහන්තක මහා විහාරය | නුවරඑළිය මහමෙව්නාව භාවනා අසපුව | කුණ්ඩසාලේ මහමෙව්නාව භාවනා අසපුව | |

මහමෙව්නාව
භාවනා අසපුව



මීගමුව වෙරළ තීරය



වෙන්නප්පුව වෙරළ තීරය




බද්දේගම වෙරළ තීරය

**වෙරළාශ්‍රිත ස්ථාන කිහිපයක ම පිරිසිදු කිරීම මෙම ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක කරන ලදි.**

මෙම වැඩසටහනට දමිළ ප්‍රජාවගේ දායකත්වය විශේෂ විය.

**2023 වර්ෂයේ දී ස්ථාන 12 තුළ** ව්‍යාපෘති පවත්වමින් මෙම ජාතික කර්තව්‍යයට දායක වීම සිදුවිය.




ගවරකැලේ දමිළ විද්‍යාලය - දෙමෝදර




අයිස්ලැබි දමිළ මහා විද්‍යාලය - බණ්ඩාරවෙල

**ඒ සඳහා සහභාගී වූ අනෙකුත් දමිළ පාසල්**

| | | | | | |
|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල අයිස්ලැබි දමිළ විද්‍යාලය | පොතුවිල් ඉද්දිරා දමිළ විද්‍යාලය | නහවිල දමිළ විද්‍යාලය | පොතුවිල් හිජ්රා දමිළ විද්‍යාලය | පින් අරාව දමිළ විද්‍යාලය | බදුල්ල ස්ප්‍රින් වැලි දමිළ විද්‍යාලය |
| බල්ලකෙටුව හිඳගල දමිළ විද්‍යාලය | දෙමෝදර ගවර කැලයේ දමිළ විද්‍යාලය | හපුතලේ පිටරත්මලේ දමිළ විද්‍යාලය | හපුතලේ පිටරත්මලේ දමිළ විද්‍යාලය | බණ්ඩාරවෙල ග්‍රේක් දමිළ මහා විද්‍යාලය | නාරංගල හාලි ඇල දමිළ විද්‍යාලය |

Youth
Distict 306 B2

# Lions Club




Lions club ආයතනය මගින් CleanUp Sri Lanka දිවයින පුරා

**ව්‍යාපෘති 137 ක් සාමාජිකයන් 6,270 කගේ**

පමණ සහභාගීත්වයෙන් පැවැත්විය.

Interact District 3220 | Rotaract District 3220




Rotaract සහ Interact ආයතන මඟින් CleanUp Sri Lanka දෙවන අදියර දිවයින පුරා

**ව්‍යාපෘති 119 ක් සාමාජිකයන් 1,660 කගේ**

පමණ සහභාගීත්වයෙන් පැවැත්විය.

# ප්‍රවර්ධන වැඩසටහන්

**Cleanup Sri Lanka ව්‍යාපෘතිය ජනගත කිරීම වෙනුවෙන් Shraddha මාධ්‍යජාලය විසින් සිදු කළ ප්‍රවර්ධන වැඩසටහන් වල විස්තර**

## Celebrity Endorsement



ප්‍රවීණ ටෙලිනාට්‍ය අධ්‍යක්ෂ චරිත් අබේසිංහ මහතා



මානසික ශක්ති සංවර්ධන උපදේශක සනත් කේ. විමලසිරි මහතා



ආදිවාසී නායක - ඌරුවරිගේ වන්නිල ඇත්තෝ



ප්‍රවීණ ජීව විද්‍යා දේශක වෛද්‍ය දිනේෂ් මුතුගල මහතා



මාධ්‍ය අධ්‍යක්ෂ සහ පොලිස් මාධ්‍ය ප්‍රකාශක
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිහාල් තල්දූව මහතා



හිටපු ක්‍රිකට් ක්‍රීඩක ලසිත් මාලිංග මහතා



හිටපු ක්‍රිකට් ක්‍රීඩක නුවන් කුලසේකර මහතා



ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ආචාර්ය සෝමරත්න දිසානායක මහතා



ප්‍රවීණ රංගනවේදිනී සුසිලා කොට්ටගේ මහත්මිය



ජනප්‍රිය රංගන ශිල්පිනී නෙහාරා පීරිස් මහත්මිය

**මීට අමතරව** - ජනප්‍රිය රංගන ශිල්පිනී බුවනි දියලගොඩ මහත්මිය, ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක වෛද්‍ය කමල් එස්. ජයසේකර මහතා, ප්‍රවීණ රංගධර මහේන්ද්‍ර පෙරේරා මහතා, ජනප්‍රිය ගායන ශිල්පී තීක්ෂණ අනුරාධ මහතා, ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ සනත් අබේසේකර මහතා, ආචාර්ය උපුලි සචිත්‍රා වර්ණකුල මහත්මිය, තරිඳු ධනංජය වීරසිංහ-ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය-මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය-කැලණිය විශ්ව විද්‍යාලය, වෘත්තීය පෞද්ගලික උපකාරක පංති දේශක සහ ග්‍රන්ථ කර්තෘ රුවමාලි ජයවික්‍රම මහත්මිය, සම්මානනීය සාහිත්‍යවේදී මහින්ද මස් ඉඩුල මහතා, මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහතා ශ්‍රී පාළි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය, අධ්‍යක්ෂ ජෙනරාල් මධ්‍යම සංස්කෘතික අරමුදල මහාචාර්ය ගාමිණී රණසිංහ මහතා, ශ්‍රී ලංකා නීති සංගමයේ හිටපු සභාපති ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා, හිටපු ක්‍රිකට් ක්‍රීඩක දිල්ෂාන් මදුශංක මහතා, රංගන ශිල්පිනී උපේකා රණසිංහ මහත්මිය ඇතුලු පිරිස **Clean up Sri Lanka** ප්‍රවර්ධන වැඩසහන සඳහා සක්‍රියව දායකත්වය ලබාදෙන ලදි.

## Animated Videos














## Information Videos













**Clean up Sri Lanka** ව්‍යාපාතියේ වැදගත්කම හා ප්ලාස්ටික් වලින් සිදුවන අවදනම මතුකරමින් මෙම **Video** පෙළ නිෂ්පාදනය විය.

## Facebook Posts





















සමාජ මාධ්‍ය තුළ ද ඒ ඒ පරිශීලකයන්ට ගැළපෙන ලෙස සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා වලින්
**Clean up Sri Lanka** හි වැදගත්කම හා සක්‍රීය දායකත්වය මතුකරමින් නිර්මාණශීලී ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබීය.

## Live Videos











**Clean up Sri Lanka** ව්‍යාපෘතියේ වැදගත්කම මතුකරමින් සජීවී ලෙස වැඩසටහන් නිෂ්පාදනය විය.
තවද වැඩසටහන් පැවැත් වූ දින රූපවාහිනී හා ගුවන්විදුලි ගුවන් කාලයෙන් සැලකිය යුතු කාලයක් වෙන් කරන ලදී.

---

| ශ්‍රද්ධා රූපවාහිනී ගුවන් කාලය | ලක්විරු ගුවන් විදුලි ගුවන් කාලය |
|---|---|
| පැය 82 | පැය 75 |

---

**2023** සහ **2024 Clean up Sri Lanka** ව්‍යාපෘතිය පිළිබඳ වැඩසටහන් නැරඹීම සඳහා පහත සබැඳියන් හරහා පිවිසෙන්න.

cleanupsrilanka.lk

Clean Up Sri Lanka

Clean Up Sri Lanka

ඒ අනුව **CleanUp SriLanka**

ව්‍යාපෘතිය මහමෙව්නාව භාවනා අසපුව,

ශ්‍රද්ධා මාධ්‍යජාලය

මධ්‍යම පරිසර අධිකාරිය,

මහ නගර සභා, ප්‍රාදේශීය සභා

ශ්‍රී ලංකා පොලීසිය, සිංහ සමාජය,

**Rotaract** ආයතනය ඇතුළු

තවත් බොහෝ ආයතන වල

දායකත්වය සහ කැපවීම මත

2024 වසරේදී දෙවන අදියරය ද

**සාර්ථකව නිම කරන ලදී.**




ශ්‍රද්ධා TV ලක්විරු FM

මධ්‍යම පරිසර අධිකාරිය Central Environmental Authority

Youth Distict 306 B2

Interact District 3220

Rotaract District 3220




2024 වසරේ CleanUp SriLanka ව්‍යාපෘති සිදු කළ ස්ථාන



.CLEANUP SRI LANKA.
යුතුකමේ
තෙවන
මෙහෙයුම
2025
One Island, One Duty. Let's Clean Sri Lanka Together
2025 වසරේදීත්
තව තවත් ශක්තිමත් වෙමින්
පිවිතුරු පියකරු
රටක් වෙනුවෙන්
සැප්තැම්බර්
සෙනසුරාදා දින
20
Cleanup
Sri Lanka
www.cleanupsrilanka.lk
සමඟින් එක්වෙමු...
ඒ වෙනුවෙන් ඔබට කරන
වගකීමේ ආරාධනයයි !




අපද්‍රව්‍ය දිරාපත් වීමට
ගතවන කාලය

Cleanup Sri Lanka ව්‍යාපෘතිය පැවැත්වෙන ප්‍රදේශ වල කැලිකසළ බැහැර කිරීම ක්‍රමවේදයකට අනුව එනම් නගර සභා හෝ ප්‍රදේශීය සභා හා සම්බන්ධව විධිමත් ක්‍රමවේදයකට අනුව බැහැර කිරීම සිදුවේ.

Cleanup
Sri Lanka
www.cleanupsrilanka.lk

## Cleanup Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ආකාරය

එකම දිනක එකම වේලාවක මුළු රට පුරා මෙම වැඩසටහන ක්‍රියත්මක වේ.
ඒ ඒ පළාත් වල සකස් කරගත් කණ්ඩායම්, නොදිරන කැළි කසළ ක්‍රමාණුකූලව එකතු කර නිසි ක්‍රමවේදයක් ඔස්සේ බැහැර කිරීම සිදුවේ.

**ප්‍රජා** (Community), **තරුණ** (Youth), **පාසල්** (School) ලෙස ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ ක්‍රියත්මක වන අතර එම කාණ්ඩ අනුසාරයෙන් දිවයින පුරා කුඩා කණ්ඩායම් මෙම පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරනු ලබයි.

## පිරිසිදු කිරීමට පිරිස එකතු කරගන්නා ආකාරය

www. cleanupsrilanka.lk වෙබ් අඩවිය ඔස්සේ සවිස්තරාත්මකව දත්ත එකතු කර ගනිමින් සහභාගි වන පිරිස ක්‍රමානුකූල ක්‍රමවේදයක් යටතේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. එසේ ලියාපදිංචි කරගන්නා පිරිසේ නායකත්වය එක් අයෙක් වෙත ලබා දී වැඩසටහන සිදු කරන ක්‍රමවේදය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාදීම සිදු කරයි.

- ක්‍රමවත්ව නොදිරන කැළිකසළ වෙන්කර ගැනීම.
- සහභාගී වන පිරිසගේ ආරක්ෂාව.
- වෙන් කරගත් කැළිකසළ නිසි අයුරින් බැහැර කිරීම.
- පිරිසිදු පරිසරයක වැදගත්කම ප්‍රායෝගිකව සමාජගත කිරීම.
- **5R** ක්‍රමය එනම් ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය අවම කිරීම පිළිබඳ පණිවිඩය සමාජගත කිරීම.

**මෙම ක්‍රියාවලිය තුළදී ම සිදු කරනු ලබයි.**

**ඒ ඒ කණ්ඩායම් වෙත ලබා දෙන ද්‍රව්‍ය සහ උපකරණ**



Jacket
( කණ්ඩායම් නායකයින් සඳහා )




Disposable Gloves




Biodegradable bags

## 2025 දීත් රට වෙනුවෙන් අපේ යුතුකම ඉටුකරන්න

## සැප්තැම්බර් 20 සෙනසුරාදා අප සමඟ එකතුවන්න...



## අපගේ අනෙකුත් සමාජ සත්කාරයන් හි සාරාංශ සටහනක්.

ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ ආරම්භයත් සමඟ එහි ප්‍රමුඛ මාධ්‍ය මෙහෙවරට සමගාමීව
**"ශ්‍රද්ධා සමාජ සත්කාර"**
නමින් සමාජ සත්කාර ව්‍යාපෘති මාලාවක් සමාජයේ උපකාර අවැසි අපේම සහෝදර පිරිස් සඳහා අස්වැසිල්ලක් වීමට දියත් කරන ලදී.

අතිශයින්ම සාර්ථකව මෙම ව්‍යාපෘති දසවසරක් මුළුල්ලේ ක්‍රියාත්මක වේ.

SCO
SHRADDHA CHARITY ORGANIZATION

visit us
www.sco.lk



## පිවිතුරු පැන් පූජා

ශ්‍රී ලංකාව පුරා වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතින නිධන්ගත වකුගඩු රෝගයෙන් **CKDu (Chronic Kidney Disease unknown)** ශ්‍රී ලංකාවාසී අපේ ම ජනතාව බේරා ගැනීමේ අරමුණින්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ සමාජ සත්කාර ඒකකයේ ප්‍රධාන පුණ්‍ය ව්‍යාපෘතියක් ලෙස "පිවිතුරු පැන් පූජා" ව්‍යාපෘතිය දසවසරක් පුරාවට සිදු කරමින් පවතී.

| ව්‍යාපෘති ප්‍රමාණය | ප්‍රතිලාභ ලබන පුද්ගලයින් |
|---|---|
| 158 | පවුල් 78,000 කට අධිකයි |

පිවිතුරු පැන් පූජා
PURE WATER FOR ALL

## Save a Baby



අඩු වයසින් උපත ලබා දින කිහිපයක් තුළ මියයන නොමේරූ ළදරුවන්ගේ ජීවිත සිය ගණනක් බේරා ගනු පිණිස මනා ඔක්සිජන් ප්‍රතිශතයෙන් යුතු (Blended), ආර්ද්‍රතාවයෙන් යුතු (Humidified), නිසි පීඩනයෙන් යුතු (Pressure Controlled), උණුසුම් (Warm) වායු දහරාවක් ඔවුන් හට පළමු හුස්ම ලෙස ලබා දිය හැකි ශ්වසනාධාර උපකරණ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් ම ආවරණය වන පරිදි ජාතික රෝහල් පද්ධතිය වෙත පරිත්‍යාග කරනු පිණිස ශ්‍රී ලංකා පරිජන්ම වෛද්‍යවරුන්ගේ සංගමයේ (Perinatal Society of Sri Lanka) ඉල්ලීම පරිදි **සේරුවිල මංගල රජමහා විහාරය** සමඟ එක්ව ක්‍රියාවට නංවන පුණ්‍ය ව්‍යාපෘතියකි.

| වැය කර ඇති මුදල | ශ්වසනාධාර උපකරණ ගණන |
|---|---|
| මිලියන 160 | 120 |

## " පුංචි හදට සුවය දෙන්න "

මනුෂ්‍යත්වයේ පාගමන



අප මාතෘ භූමියේ වසරකට උපදින දරුවන් අතුරින් 3000 ක් පමණ දෙනා මෙලොව එළිය දකින්නේ හෘදය ආශ්‍රිත රෝග සහ තවත් දැඩි රෝග සහිතවයි. නමුත් මේ වන විට ළමා රෝහලේ පවතින පහසුකම් අනුව වසරකට සිදු කළ හැක්කේ **හෘද සැත්කම් 1600 ක් පමණි**. ඒ නිසා ප්‍රතිකාර නොමැතිව **මියයන 1500-1600 ක්** පමණ වන දරුවන්ගේ ජීවිත සුරක්ෂිත කරනු පිණිස ළමා රෝහලට අනුබද්ධව ඉදිකිරීමට යෝජිත මහල් 10 කින් යුතු අංගසම්පූර්ණ රෝහල් පරිශ්‍රය තනවනු පිණිස අවශ්‍ය අරමුදල් රැස් කර දීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කරනු ලැබී ය.

Little Hearts

ශ්‍රද්ධා TV | Sri Lanka College of Paediatricians

| ලබාදුන් දායකත්වය | මිලියන 4.5 කට අධිකයි (වර්ෂය 2017) |
|---|---|

## ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව



ආර්ථික අපහසුතා ජය ගනිමින් ඉගෙනුම සඵල කරගැනීමට දුවා දරුවන්ට සවියක් වීම පිණිස **ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව** ව්‍යාපෘතිය දස වසරකට අධික කාලයක් දියත් කරනු ලබයි.

| ප්‍රතිලාභ ලබන දූ දරුවන් ගණන |
|---|
| 2,536 කට අධිකයි |

| වැය කර ඇති මුළු මුදල |
|---|
| මිලියන 81 කට අධිකයි |



## ශ්‍රද්ධා රුධිර දාන

ජාතික රුධිර සංචිතයට සවියක් වෙමින් සෑම වර්ෂයකදීම රුධිරය අඩුවෙන් ලැබෙන මාස තෝරා එම රුධිර හිඟය මග හරවා ගැනීම පිණිස මෙම වැඩසටහන දියත් වේ.

| ලබාදී ඇති රුධිර ඒකක ගණන |
|---|
| 58,226 කට අධිකයි |



## ශ්‍රද්ධා ශිල්ප යාත්‍රා

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ දුවා දරුවන්ගේ අධ්‍යාපනය ඉදිරියට පවත්වාගෙන යාමට පිටිවහලක් වීම පිණිස ය. මෙහිදී ප්‍රතිලාභ අවැසි දරුවන් සොයා නව අධ්‍යයන වර්ෂයන්වලට අවශ්‍ය සියලුම පාසල් පොත් පත් ලබාදීම සිදු කරනු ලැබේ. **මෙම වැඩසටහන 2015 වසරේ දී ආරම්භ විය.**

| | |
|---|---|
| පාසල් උපකරණ කට්ටල ගණන | 6,969 |
| වැය කර ඇති මුළු මුදල | මිලියන 21 කට අධිකයි |

## මව්බිම වෙනුවෙන් එක්වෙමු



**COVID** අවදානම පැතිර ගිය වකවානුවේදී සෞඛ්‍ය කාර්ය මණ්ඩල ප්‍රමුඛ ආරක්ෂක අංශ සුවිශේෂී වැඩපිළිවෙළක් දියත් කරමින් වසංගත තත්ත්වයෙන් රට මුදවා ගැනීමට දැඩි කැපවීමක් සිදු කරමින් සිටි වකවානුවක ඔවුන්ට සවියක් වනු පිණිස සෞඛ්‍ය උපකරණ **"මව්බිම වෙනුවෙන් එක්වෙමු"** පුණ්‍ය ක්‍රියාන්විතය යටතේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල හා ආරක්ෂක අංශ වෙත ලබා දෙනු ලැබී ය.

| වැය කර ඇති මුළු මුදල |
|---|
| මිලියන 25 කට අධිකයි |



## "ජාතියේ ගොවි විරුවන් රැකගනිමු"

**Covid-19** වසංගතය නිසා ගොවි මහතුන්ගේ දහඩිය මහන්සියෙන් එලදැරූ එළවළු අස්වැන්න විනාශ වන්නට නොදී දුප්පත් ගම්මානවල ජනතාව වෙත සහ ප්‍රත්‍ය පහසුව අඩු **විහාරස්ථාන, ආරණ්‍ය සේනාසන, වැඩිහිටි නිවාස සහ ළමා නිවාස** වෙත නොමිලේ පරිත්‍යාග කිරීම සඳහා covid වසංගත කාලයේදී ක්‍රියාවට නැංවූ වැඩපිළිවෙලකි.

| | |
|---|---|
| එළවළු හා වියලි ආහාර | 133,000 KG |
| ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් ගණන | 40,000 |
| වැය කර ඇති මුළු මුදල | මිලියන 06 කට අධිකයි |

NKPF
National Kidney Patient's Fund

## ජාතික වකුගඩු රෝගීන්ගේ අරමුදල



රජරට සහ තදාසන්න ප්‍රදේශයන්හී වෙසෙන ආර්ථික අපහසුතා ඇති වකුගඩු රෝගීන් සායනයන් වෙත රැගෙන යාමත් ඔවුන්ගේ ඖෂධවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසා දීම මෙම ව්‍යපෘතියේ අරමුණයි.

| |
|---|
| ලබාදී ඇති මුළු මුදල |
| මිලියන 19 කට අධිකයි |

ශ්‍රද්ධා අභය දාන

## ශ්‍රද්ධා අභය දාන

මරණයට කැප වූ සතුන් නිදහස් කර ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘතියකි.



| | |
|---|---|
| අභයදානය ලබාදුන් සතුන් ගණන | 1,560 |
| කිරි ගොවීන් ගණන | 322 |
| වැය කර ඇති මුළු මුදල | මිලියන 10 කට අධිකයි |



## අසරණ සරණ

## ශ්‍රද්ධා අසරණ සරණ

අප මව්බිම ඒ ඒ කාලයන්වල මුහුණ දෙන ව්‍යසන හා ස්වාභාවික විපත්වලදී අසරණ ජනතාව වෙනුවෙන් සරණක් වීමට ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

| |
|---|
| වැය කර ඇති මුළු මුදල |
| මිලියන 28 කට අධිකයි |



ශ්‍රද්ධා ගිලානදාන

## ශ්‍රද්ධා ගිලානදාන

සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම, රෝහල් වල නේවාසික රෝගීන් හා කාර්ය මණ්ඩලයට, රෝගීන් බැලීමට පැමිණෙන පිරිසට කෙටි ආහාර සහ ඖෂධීය කැඳ ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථා වලදී රෝහල් වලට අවශ්‍ය වන ඖෂධ, වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම **"ශ්‍රද්ධා ගිලානදන"** පුණ්‍ය ව්‍යාපෘතිය යටතේ සිදුවේ.

| | |
|---|---|
| රොහල් ඇඳන් ගණන | 494 |
| රෝහල් ගණන | 127 |
| වැය කර ඇති මුළු මුදල | මිලියන 120 කට අධිකයි |

# මාධ්‍ය ශක්තිය

ශ්‍රද්ධා TV

Shraddha TV UHF 55

ලක්විරු FM

Lakviru FM 105.2, 105.4 islandWide

---

YouTube

Shraddha TV - 1,102,768 Subscribers
Lakviru FM - 68,316 Subscribers
Ahasgawwa - 246,010 Subscribers
Buddhism - 2,710,046 Subscribers

facebook

Shraddha TV - 871,205 Followers
Lakviru FM - 149,034 Followers
Ahasgawwa - 241,629 Followers
Buddhism - 479,640 Followers

මීට අමතරව cleanup වැඩසටහනට ම වෙන් වූ නිල YouTube හා Facebook අඩවියන් ද , ඒ සඳහා www.cleanupsrilanka.lk වෙබ් අඩවිය ද ආරම්භ කර ඇත.

---

Shraddha TV - UHF 55 Iceland Wide

PEOTV Channel Number - 99

Dialog Television Channel Number - 27

freesat Channel Number - 22

# ජනාධිපති පරිසර සම්මාන උළෙල
# 2024




## 2024 ජනාධිපති පරිසර සම්මාන උළලේ දී
## ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

- **ජනාධිපති පරිසර රන් සම්මානය**
  ශ්‍රද්ධා රූපවාහිනිය
- **ජනාධිපති පරිසර රිදී සම්මානය**
  ශ්‍රද්ධා ප්‍රවෘත්ති අංශය
- **ජනාධිපති පරිසර කුසලතා සම්මානය**
  ශ්‍රද්ධා රූපවාහිනිය
- **ජනාධිපති පරිසර කුසලතා සම්මානය**
  ලක්විරු ගුවන් විදුලිය

පරිසරය වෙනුවෙන් දැක්වූ මාධ්‍ය දායකත්වය වෙනුවෙන්

**දැයක් අභිමුව ගෞරවයට පාත්‍ර වූ වගයි !**

Cleanup
Sri Lanka
cleanupsrilanka.lk

පිවිතුරු පියකරු රටක්